# ශ්‍රී ලංකා ජාතික ගිණුම් මාධ්‍ය සටහන

## 2016 තෙවැනි කාර්තුව

## නිෂ්පාදන ප්‍රවේශයෙන්

### 2010 පාද වර්ෂය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

## 1.1 2016 තෙවැනි කාර්තුව

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිලගණන් (2010) යටතේ 2016 වර්ෂයේ තෙවැනි කාර්තුව (ජූලි,අගෝස්තු,සැප්තැම්බර්) සඳහා රුපියල් මිලියන 2,270,171 ක් ලෙස වාර්තා වේ. මෙය 2015 තෙවැනි කාර්තුව සඳහා වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතය වන රුපියල් මිලියන 2,181,275 ට සාපේක්ෂව සියයට 4.1 ක ධනාත්මක වර්ධනයක් වේ.

ආර්ථිකය සමන්විත මුලික අංගයන් වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ හා සේවා මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු පවත්නා මිල යටතේ සමස්ත දළදේශීය නිෂ්පාදිතයට දක්වන ප්‍රතිශත දායකත්වය පිලිවෙලින් සියයට7.6 ක්, සියයට 30.5ක් සියයට 56.0ක් සහ සියයට 5.9ක් වේ.

2016 තෙවැනි කාර්තුව සඳහා, කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 6.8 ක ඉහල ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර සේවා ආර්ථික කටයුතු සියයට 4.7ක ධනාත්මක වර්ධනයක් ද කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 1.9ක ඍන වර්ධනයක් ද වාර්තා කර ඇත.

සෑම ආර්ථික කටයුත්තකම, දළ නිමැවුමෙන් අතරමැදි යෙදවුම් අඩුකිරීමෙන් එක් එක් ආර්ථික කටයුත්තක දළ එකතුකළ අගය ගණනය කෙරේ. අතරමැදි යෙදවුම් ගැනුම් මිලට ඇස්තමේන්තු වුවද, දළ නිමැවුම ඇස්තමේන්තු වන්නේ මුලික මිලට වේ. එබැවින් දළ එකතුකල අගය ද මුලික මිලට වාර්තා වේ. දළදේශීය නිෂ්පාදිතය ගණනය වන්නේ වෙළඳපොල මිල ගණන් අනුව පමණි. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී සමස්ත ආර්ථිකයේ දළ එකතු කල අගයට භාණ්ඩ මත අය කෙරෙන බදු එකතුකොට එම සහනාධාර අඩු කල යුතුය. 2010 පාද වර්ෂය යටතේ ගණනය කරනු ලබන නව ජාතික ගිණුම් මාලාවේ දළ දේශීය නිෂ්පාදිතය, සමස්ත ආර්ථිකයේ දළ එකතු කල අගයට භාණ්ඩ මත අය කෙරෙන බදු එකතුකොට එම සහනාධාර අඩුකිරීම යන ගැලපීම සිදු කිරීමෙන් ගණනය කෙරේ.

2016 වර්ෂයේ තෙවැනි කාර්තුව සඳහා භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකළ බදු දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 5.9ක් වේ. 2015 තෙවැනි කාර්තුව තුලදී මෙම අගය සියයට 8.3ක් විය.

රුප සටහන 1හි දැක්වෙන පරිදි 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුව තුලදී පැවතුනු වියලි කාලගුණ තත්ත්වයන් මත රට තුල කෘෂි ආර්ථික කටයුතු සැලකිය යුතු මට්ටමින් පහත වැටීමක් වාර්තා කර ඇත. මුලිකවම කෘෂිකාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදනයට ඉහල දායකත්වයක් සපයන ප්‍රධාන උප ආර්ථික කටයුතු වන "තේ වගාව", "වී වගාව" , "රබර් වගාව", "කුළුබඩු, සුවඳ වර්ග, ඖෂධ හා අදාල වගාවන් ", "වෙනත් ස්ථිර භෝග වගාව" සහ " එළවළු වගාව" පිළිවෙලින් සියයට20.4ක්, සියයට 20.0ක් ,සියයට17.8ක්, සියයට 9.0ක්, සියයට 7.7ක් සහ සියයට7.2ක් ලෙස ඍන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

එසේ නමුත් "වනවගා සහ දැව" සියයට 30.0ක් ද, "මිරිදිය මත්ස්‍ය කර්මාන්තය" සියයට 20.8ක් ද ලෙස ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර , "කරදිය මත්ස්‍ය කර්මාන්තය", """පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්", "සත්ත්ව නිෂ්පාදන" සහ කෙටිකාලීන භෝග වගාව" යන ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 7.4, සියයට 6.9, සියයට 6.9 සහ සියයට 6.5ක් වශයෙන් සාමාන්‍ය වර්ධන වේගයන් ද , පොල් වගාව ප්‍රධාන කොට ඇති "තෙල් සහිත පලතුරු වගාව" සියයට 0.1ක්, සහ "පළතුරු වගාව" සියයට 1.3ක් ලෙස සුළු වර්ධන වේගයන් ද වාර්තා කර ඇතත් සමස්ථ කෘෂිකර්මාන්තයේ ධනාත්මක වර්ධනයක් ඇති කිරීමට මෙම කෘෂිකර්මාන්ත කටයුතු ප්‍රමාණවත් වී නොමැත.

**රූප සටහන 1**




2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුව තුලදී සමස්ත කර්මාන්ත අංශය සියයට 6.8ක වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර කර්මාන්ත අංශයට ඉහල දායකත්වයක් සපයන බොහෝ ආර්ථික කටයුතු ද ධනාත්මක වර්ධනයන් වාර්තා කර ඇත.

විශේෂයෙන්ම කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා ඉහල දායකත්වයක් ලබා දෙන "ඉදිකිරීම්" උප ආර්ථික කටයුත්ත 2015 තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 14.4ක වර්ධන වේගයක් වාර්තා කර ඇත.

මීට අමතරව "මල පවාහන පද්ධති ආශ්‍රිත කර්මාන්ත" සහ "මූලික ලෝහ හා යකඩ නිෂ්පාදන කර්මාන්ත", පිලිවෙලින් සියයට 17.3ක්, සියයට15.4ක්, වශයෙන් ඉහල ධනාත්මක වර්ධන වේගයන්

වාර්තා කර ඇත. එසේම "ගෘහභාණ්ඩ නිෂ්පාදනය", "පතල් හා කැණීම් කර්මාන්ත" ,"විදුලිය නිෂ්පාදන හා බෙදා හැරීම" සහ "ජලය බෙදා හැරීම" යන කර්මාන්තයන් පිළිවෙලින් සියයට 14.1ක්, සියයට 13.5ක්, සියයට 7.8ක් සහ සියයට 7.4ක සතුටුදායක වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත ක්ෂේත්‍රයට ඉහල දායකත්වයක් ලබා දෙන "ආහාර, බීමවර්ග සහ දුම්කොළ" කර්මාන්තය සහ "ඇඟලුම් ආශ්‍රිත කර්මාන්තය " ද පිළිවෙලින් සියයට 2.6 ක් සහ සියයට 3.3ක් වශයෙන් 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව තව දුරටත් වර්ධනයන් වාර්තා කර ඇත. "රබර් සහ ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්තය" සහ "අනෙකුත් නිෂ්පාදන" යන ආර්ථික කටයුතු මෙම කාර්තුව තුල 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව සියයට 5.8ක් බැගින් වන සමාන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**රූප සටහන 2**




2015 තෙවැනි කාර්තුව හා සමගාමීව මෙම කාර්තුව තුලදී ද සමස්තයක් ලෙස සේවා අංශය සියයට 4.7ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. රූප සටහන 3 හි දැක්වෙන පරිදි සේවා උප ආර්ථික ක්‍රියාකාරකම් වන "මූල්‍ය සේවා", "රක්ෂණ කටයුතු", "විදුලි සංදේශ සේවා", සහ "අධ්‍යාපන සේවා", සියයට 12.9ක්, සියයට 12.3ක්, සියයට 11.7ක් සහ සියයට 10.2ක් ලෙස සේවා අංශය තුල කැපී පෙනෙන වර්ධන වේගයන් වාර්තා කරඇත. මීට අමතරව "තැපැල් හා කුරියර් සේවා" , "පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය", "රාජ්‍ය පරිපාලන සේවාවන්", "දේපල වෙළඳාම්", "තොග සහ සිල්ලර වෙළඳාම" පිළිවෙලින් සියයට 6.2ක්, සියයට 5.8ක්, සියයට 5.2ක්, සියයට 4.7ක් සහ සියයට 4.6ක් වශයෙන්

වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේම මෙම කාර්තුව තුල "වෘත්තීය සේවා" සහ "වැඩසටහන් සකස් කිරීම හා විකාශන සේවා"පිළිවෙලින් සියයට 3.6ක සහ සියයට 14.6ක සෘන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**රූප සටහන 3**




ආර්ථිකයේ මිල මට්ටම්හි සිදුවන වෙනස මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය (2010=100), 2016 තෙවැනි කාර්තුව සඳහා 136.38 ක් ලෙස වාර්තා වේ. 2015 තෙවැනි කාර්තුව සඳහා මෙම අගය 132.22ක් ලෙස වාර්තා විය. ඒ අනුව මෙම කාර්තුව සඳහා උද්ධමන වේගය සියයට 3.1ක් ලෙස වාර්තා වේ.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) (2006/2007=100) 2015 තෙවැනි කාර්තුව සඳහා වාර්තා වූ 182.0 සිට 2016 තෙවැනි කාර්තුව සඳහා 190.2 දක්වා ඉහල යාමක් වාර්තා කර ඇති අතර මෙම කාල සීමාව තුලදී සියයට 4.5ක උද්ධමන වේගයක් වාර්තා කර ඇත.

## 1.2 කෘෂිකර්මාන්ත ක්‍රියාකාරකම්

2015 තෙවන කාර්තුවේ දී සියයට 2.5ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළ " ධාන්‍ය වගා කිරීම " 2016 තෙවැනි කාර්තුවේදී සියයට 2.0ක සෘන වර්ධනයක් වාර්තා කර ඇත.

2015 තෙවැනි කාර්තුව තුලදී සියයට 58.6ක ඉහළ වර්ධන අනුපාතිකයක් වාර්තා කළ වී වගාව මෙම කාර්තුව තුලදී සියයට 20.0ක පසුබැස්මක් වාර්තා කර ඇත. 2015 යල කන්නයට සාපේක්ෂකව මෙවර යල කන්නය තුලදී වී නිෂ්පාදනය සඳහා විශාල වශයෙන් දායක වන අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය, මඩකලපුව, කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල පැවති නියඟය නිසා එම දිස්ත්‍රික්ක වල වී අස්වැන්න පිළිවෙලින් සියයට 5.9, සියයට 14.9, සියයට 25.9, සියයට 9.2, සියයට 19.2ක් සහ සියයට 14.1ක් ලෙස අඩු වීමක් පෙන්වා ඇත. 2016 යල කන්නය තුල වී වගා කළ මුළු බිම් ප්‍රමාණය හා වී අස්වැන්න නෙලන ලද බිම් ප්‍රමාණ පිළිවෙලින් සියයට 20.1කින් හා සියයට 19.7කින් අඩු වීම ද මේ සඳහා බලපා ඇත.

"එළවළු වගා කිරීම" උප ආර්ථික කාර්යයෙහි එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුව සඳහා සියයට 7.2ක පසුබෑමක් වාර්තා කර ඇත. ප්‍රධාන වශයෙන් මෙම කාර්තුව තුලදී ලොකු ළූනු නිෂ්පාදනයේ සියයට 35.1ක අඩුවීමක් සිදු වී ඇති අතර එය මෙම සෘන වර්ධනය කෙරෙහි බලපා ඇත.

මෙම කාර්තුව තුල "පළතුරු වගා කිරීම" උප ආර්ථික කාර්යය සියයට 1.3ක වර්ධනයක් වාර්තා කර ඇත. දෙහි හා දොඩම් වගාවන්හි ඇති වූ වර්ධනයන් මේ සඳහා බලපා ඇත.

පොල් වගාව ප්‍රධාන කොට ඇති " තෙල් සහිත පලතුරු භෝග වගාව " ස්ථාවර මිල යටතේ 2016 තෙවැනි කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදනයට එකතු කළ අගය රුපියල් මිලියන 16,408ක් වේ. ඒ අනුව මෙහි ස්ථාවර මිල යටතේ වර්ධනය 2015 තෙවැනි කාර්තුව හා සලකා බැලීමේදී සියයට 0.1ක වර්ධනයක් ලෙස වාර්තා වේ. සාමාන්‍යයෙන් තෙවැනි කාර්තුව සඳහා පොල් එළදාවේ රටාව අධ්‍යයනය කිරීමේදී ජූලි, අගොස්තු සහ සැප්තැම්බර් මාස වල පොල් එළදාව ක්‍රමික අඩු වීමක් පෙන්නුම් කල ද 2016 තෙවැනි කාර්තුව තුල දී එය වඩාත් අඩු එළදාවක් ලෙස මෙවර වාර්තා වේ. මෙම කාර්තුව තුල දී රට මුහුණ පෑ දැඩි වියළි කාලගුණ තත්වය මීට මුලික වී ඇත. මේ අනුව 2016 තෙවැනි කාර්තුව සඳහා රට තුල පොල් නිෂ්පාදනය සියයට 0.05 කින් ඉතා සුළුවෙන් වර්ධනය වී ඇත. මෙම කාල පරිච්ඡේදය තුල දී පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ මිල රු 32.96 ක් සිට රු. 26.64 දක්වා සියයට 19.17 අඩු වීමක් වාර්තා කර ඇත.

2015 තෙවැනි කාර්තුව තුල සියයට 2.4ක පසුබැස්මක් වාර්තා කළ "තේ වගා කිරීම" උප ආර්ථික අංශයෙහි වර්ධන වේගය 2016 මෙම කාර්තුව තුලදී තව දුරටත් සියයට 20.4 දක්වා අඩු වීමක් වාර්තා කර ඇත. එසේ වුවද 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුවේදී කොළඹ තේ වෙළඳපොලේ තේ කි.ග්‍රෑම් 1ක් සඳහා සාමාන්‍ය විකුණුම් මිල රු. 383.78 සිට රු.478.78 දක්වා සියයට 24.75ක වැඩි වීමක් වාර්තා කර ඇත. ලෝක වෙළඳපොලේ ශ්‍රී ලංකා තේ සඳහා ඇති ඉල්ලුම වැඩි වීම නිසා මෙසේ තේ සඳහා මිල ගණන් වැඩිවී ඇත. තේ වගා කරන ප්‍රදේශ වල පැවති වියළි කාලගුණික තත්වය හේතුවෙන් තේ ගස් වියළීමේ තත්වයක් උදා වූ අතර එමනිසා තේ දළු නිෂ්පාදනය අඩු වී ඇත. තවද පොහොර යෙදීම අඩු වීම මෙම තේ නිෂ්පාදනය අඩුවීම කෙරෙහි බල පා ඇත. 2015 තෙවැනි කාර්තුවේ තේ අපනයනය කි.ග්‍රෑම් මිලියන 74.55ට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුවේ තේ අපනයනය කි.ග්‍රෑම් මිලියන 76.30ක් දක්වා සියයට 2.34ක වැඩි වීමක් වාර්තා කර ඇත. එමෙන්ම මෙම කාර්තුව තුල සමස්ත තේ නිෂපාදනය සඳහා සියයට 66.1ක පමණ දායකත්වයක් ලබාදෙන පහත රට තේ නිෂ්පාදනය 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුව තුල සියයට 19.8ක අඩු වීමක් වාර්තා කර ඇත.

2015 වසරට සාපේක්ෂව කෝපි හා කොකෝවා අයත් "අනෙකුත් පාන වර්ග වගා කිරීමේ" ආර්ථික කටයුත්ත මෙම කාර්තුව තුලදී සියයට 4.2ක පසුබැස්මක් වාර්තා කර ඇත. 2015 අවසාන කාර්තුව හා 2016 මුල් කාලය තුල පැවති දැඩි නියඟය හේතුවෙන් මෙම කන්නය තුල කෝපි හා කොකෝවා අස්වැන්න අඩු වී ඇති බව වාර්තා වේ. තවද මෙම භෝගය සඳහා ලැබෙන ආදායම අඩු වීම හේතුවෙන් ගොවීන් මෙම වගාවන්ගෙන් ඈත්වීම ද මේ සඳහා බලපා ඇත.

රබර් වගාව සඳහා 2012 තෙවැනි කාර්තුවේ සිට 2015 තෙවැනි කාර්තුව දක්වා වර්ධන අනුපාතිකයන් ක්‍රමයෙන් පහත වැටෙමින් පැවතුන අතර 2016 තෙවැනි කාර්තුවේදී ද එය තව දුරටත් සියයට 17.8ක පසුබැස්මක් වාර්තා කර ඇත. දේශීය හා විදේශීය වෙළඳපොලේ රබර් කිලෝ ග්‍රෑම් 1ක් සඳහා වන මිල ගණන් පහල යාම නිසාත්, රබර් කිරි කැපීම සඳහා කම්කරු කුලිය වැඩි වීම නිසාත් රබර් කිරි කැපීම අඩු වී ඇති බව වාර්තා වේ. තවද 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂකව 2016 තෙවැනි කාර්තුව තුල රබර් කිලෝ ග්‍රෑම් එකක් සඳහා ගෙවන මිල රු. 285.08 සිට රු.221.07 දක්වා සියයට 22.45කින් අඩු වී ඇත.

2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුව තුල දී "වෙනත් ස්ථාවර බෝග වගා කිරීම " හි වර්ධන වේගය ස්ථාවර මිල යටතේ සියයට 7.7 පසුබැස්මක් වාර්තා කර ඇත. මෙහි දී මෙම කාර්තුව තුල පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් බුලත් , පුවක්, සහ රා නිෂ්පාදනයන් පසුබෑමකට ලක් වී ඇත. 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී පොල් රා නිෂ්පාදනය හා තල් රා නිෂ්පාදනය පිලිවෙලින් සියයට 19.0කින් සහ සියයට 12.0කින් අඩු වී ඇත. එමෙන්ම බුලත් සඳහා නිෂ්පාදකයාගේ මිල මෙම කාර්තුව තුල දී සියයට සියයකින් ඉහල ගොස් ඇත.

සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම සඳහා දායක වන මස් පිණිස සතුන් ඇති කිරීම , කිරි නිෂ්පාදනය සහ බිත්තර නිෂ්පාදනය සමස්තයක් ලෙස ස්ථාවර මිල ගණන් යටතේ 2016 තෙවැනි කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදනයට එකතු කළ අගය රුපියල් මිලියන 14,866ක් වේ. ඒ අනුව 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි කාර්තුව තුල දී සියයට 6.9ක වර්ධන වේගයක් වාර්තා වේ. මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම, කිරි නිෂ්පාදනය සහ බිත්තර නිෂ්පාදනයන්හි නිමැවුම පිළිවලින් සියයට 4.9, සියයට 9.5ක් සහ සියයට 11.3ක් ලෙස වර්ධනය වී ඇත. මෙම කාල සීමාවතුලදී මස් පිණිස කුකුළන් ඇති කිරීම උප ආර්ථික කටයුත්තෙහි නිෂ්පාදකයාගේ මිල රුපියල් 356/-ක සිට රුපියල් 454/-ක් දක්වා ඉහල යාමක් වාර්තා වේ.

“පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්” 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී සියයට 6.9ක වර්ධනයක් වාර්තා කොට ඇත. මෙහිදී පැල බෝ කිරීම උප ආර්ථික කටයුත්ත යටතේ 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පොල් පැළ නිෂ්පාදනය වැඩි වී ඇත. මෙම කාර්තුව තුල දී පොල් පැළ මිලියන 1.2 නිෂ්පාදනය කරනු ලැබඇත. මෙම පොල් පැල ඉදිරි කාලය තුල දී නැවත වගා කිරීම් සහ ගෙවතු වගා වැඩසටහන් සඳහා උපයෝගී කර ගැනීමට නියමිතය. මෙම කාර්තුව තුල දී රබර් පැළ නිෂ්පාදනය සැලකියයුතු පසු බැස්මක් වාර්තා කොට ඇත. තෙල් මිල පහත වැටීමත් සමග ලෝකයේ කෘතිම රබර් නිෂ්පාදනය සිඝ්‍රයෙන් ඉහල යාම නිසා දේශීය සහ විදේශීය වෙළඳපොල තුල ස්වභාවික රබර් මිල පහත වැටීම හේතුවෙන් රබර් වගාකරුවන් රබර් කර්මාන්තයෙන් ඈත් වීම මීට ප්‍රධාන හේතුව වී ඇති බව නිරීක්ෂණය වේ. 2015 තෙවැනි කාර්තුව හා සැසඳීමේදී තේ පැල නිෂ්පාදනය ද මෙම කාර්තුව තුල අඩු වීමක් වාර්තා කරයි. මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ තේ වගා ප්‍රදේශයන්හි පැවති අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් තේ පැල වගා කිරීම අඩුවීම මෙන්ම වත්මන් තේ වෙළඳපොළෙහි සිදු වී ඇති අස්ථාවරභාවය හේතුවෙන් තේ වගා කරුවන් අධෛර්යමත් වීමද බව වාර්තා වී ඇත.

රාජ්‍ය දැව සංස්ථාව විසින් නිමවන ලද දැව කඳන් ප්‍රමාණය පසුගිය වසරේ තෙවැනි කාර්තුවේ එම නිමැවුමට සාපේක්ෂව 32.7 % කින් වර්ධනය වී ඇත. ඊට අමතරව එම නිමවුමේ වටිනාකම 37.0 % කින් ඉහල ගොස් ඇති බවද ඒ සමගම පෙන්නුම් කරයි. ඒ අනුව රටේ සමස්ත දැව කඳන් නිමැවුම ඉහල වර්ධනයක් වී ඇති බවට නිමානය කොට ඇත. දර භාවිතයේ හා දැව භෝග වගාව විශේෂ වර්ධනයක් පෙන්නුම් කොට නොමැතිමුත් වන වගාව හා දැව කඳන් නිෂ්පාදනය යන ආර්ථික කටයුත්තේ සමස්ත වර්ධනය 30% ක පමණ ඉහළ අගයක් දක්වයි.

2015තෙවැනි කාර්තුවට සාපේක්ෂව කරදිය මසුන් ඇල්ලීම හා ජලජීවි වගා අංශයේ නිෂ්පාදනය මෙම කාර්තුවේදී සියයට 7.4ක වර්ධනයක් ලබා ඇත. 2016 තෙවැනි කාර්තුව තුල පැවති හිතකර කාලගුණ

තත්ත්වය හා නැගෙනහිර පළාතේ මාදැල් කර්මාන්තය තුලින් ඉහල මත්ස්‍ය අස්වැන්නක් ලැබීම හේතුවෙන් කරදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවී ඇත.

මිරිදිය මසුන් ඇල්ලීම හා ජල ජීවි වගා උප අංශය 2015තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016තෙවැනි කාර්තුව තුල සියයට 20.8 ක වර්ධනයක් ලබා ඇත.2016 තෙවැනි කාර්තුව තුල පැවති වියලි කාලගුණ තත්ත්වය හේතුවෙන් ජලාශ වල ජල මට්ටම් පහල යාම නිසා ඉහල මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනීමට හැකි වී ඇත.

## 1.3 කර්මාන්ත ක්‍රියාකාරකම්

2015 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 9.7 ක වර්ධනයක් ලබා තිබූ “පතල් හා කැණීම් කර්මාන්තය” 2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී තව දුරටත් සියයට 13.5කින් ඉහළයාමක් පෙන්නුම් කරයි. පතල් හා කැණීම් කර්මාන්තය කෙරෙහි සෘජුවම බලපානු ලබන ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වී ඇති වර්ධනය මෙයට හේතු වී ඇත.

“ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය” 2015 තෙවැනි කාර්තුවේ සියයට 8.7 ක වර්ධනයක් පෙන්වූ අතර 2016 තෙවැනි කාර්තුවේදී එය සියයට 2.6 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම අංශයේ නිමැවුම් වටිනාකම 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව සියයට 6.2 ක ඉහල අගයක් වාර්තා කර ඇත.

“රෙදිපිළි, ඇඟළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය” 2016 තෙවැනි කාර්තුවේදී සියයට 3.3ක වර්ධනයක් පෙන්වා ඇත. මෙම අංශයේ නිමැවුම් වටිනාකම සියයට 6.8කින් ඉහල යාම මීට හේතුවී ඇත.

2015 තෙවැනි කාර්තුවේදී සියයට 8.9 ක වර්ධනයක් ලබා තිබූ “අඟුරු නිෂ්පාදනය සහ ඛණිජ තෙල් ද්‍රව්‍ය පිරිපහදුව නිෂ්පාදන කර්මාන්තය” 2016 තෙවැනි කාර්තුවේදී සියයට 15.1 ක පසුබෑමක් පෙන්වා ඇත. ඛණිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණය සියයට 16.0කින් පහත යාම මීට හේතුවී ඇත.

“රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තය” 2015 තෙවැනි කාර්තුවේදී සියයට 1.2 ක පසු බෑමක් පෙන්නුම් කල අතර 2016 තෙවැනි කාර්තුවේදී සියයට 5.8කින් වර්ධනය වී ඇත. මෙම අංශයේ නිමැවුම් වටිනාකම සියයට 6.1 කින් ඉහල ගොස් ඇත.

2015 තෙවැනි කාර්තුවේදී සියයට 16.8 ක වර්ධනයක් ලබා තිබූ “මූලික ලෝහ වර්ග නිෂ්පාදනය සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන (යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැර) කර්මාන්තය” 2016 තෙවැනි කාර්තුවේදී සියයට 15.4 ක වර්ධනයක් ලබා ඇත. 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 තෙවැනි

කාර්තුවේදී මූලික ලෝහ වර්ග සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන නිමැවුම් වටිනාකම සියයට 14.6 කින් ඉහල යාම මේ සඳහා බලපා ඇත.

"ගෘහභාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය" 2015 තෙවැනි කාර්තුවේදී සියයට 10.8 ක වර්ධනයක් පෙන්නුම් කල අතර මෙම කාර්තුවේදී මෙම කර්මාන්තය සියයට 14.1 ක වර්ධනයක් ලබා ඇත. මෙම කර්මාන්තයේ නිමැවුම් වටිනාකම 2016 තෙවැනි කාර්තුවේදී සියයට 28.3 කින් ඉහල ගොස් ඇත.

"විදුලිය නිෂ්පාදනය" කර්මාන්තයෙහි මූර්ත එකතු කළ අගය 2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේ දී සියයට 7.8 කින් ඉහළ ගොස් ඇත. එය 2015 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 8.6 කින් ඉහළ ගොස් තිබිණි. අදාළ කාලපරිච්ඡේදය තුළ මුළු විදුලිබල ජනනය ගිගාවොට් 3402 සිට ගිගාවොට් 3672 දක්වා සියයට 7.95කින් ඉහළ යාමක් වාර්තා විය. එසේම මෙම කාර්තුව තුල දී සමස්ත විදුලිබල ජනනයෙන් ජල විදුලිබල ජනනය සහ තාප, ගල් අඟුරු විදුලිබල ජනනය අතර අනුපාතය 30:70 ලෙස සටහන් විය. එම අනුපාතය 2015 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී 48:52ක් විය.2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී විදුලිබල විකුණුම් ආදායම සියයට 60ක ඉහළ යාමක් වාර්තා වී ඇත.

2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී "ජලය එක්රැස් කිරීම,පිරිසිදු කිරීම සහ බෙදාහැරීම" යන ආර්ථික කටයුත්ත මූර්ත වශයෙන් සියයට 7.4ක ඉහල යාමක් වාර්තා වී ඇත. ජලය සැපයුම් ප්‍රමාණය 2015 වර්ෂයේ තෙවැනි කාර්තුවේ පැවති ඝන මීටර දහස් 154,337සිට මේ කාර්තුවේ ඝන මීටර දහස් 166,277දක්වා සියයට 7.7 කින් ඉහල ගොස් ඇත. එමෙන්ම මෙහි අලෙවි ආදායම සියයට 14.4කින් ඉහළ ගොස් ඇත.

2015 තෙවැනි කාර්තුව හා සංසන්දනයේදී 2016 තෙවැනි කාර්තුව සඳහා "ඉදිකිරීම් කර්මාන්තය" සියයට 14.4 කින් වර්ධනය වී ඇත. මෙම කාර්තුව තුලදී සමස්ත සිමෙන්ති නිෂ්පාදනය සියයට 30.45 කින් ඉහල ගොස් ඇත. මෙහිදී සිමෙන්ති ආනයනය සියයට 40.29කින් ද දේශීය නිෂ්පාදනය 15.2 කින් ද ඉහල ගොස් ඇත. මෑත වර්ෂවලදී රජය විසින් ඉදිකිරීම් කටයුතු සඳහා දරන ලද අඩුම වියදම 2015 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා විය. ඒ අනුව 2016 තෙවන කාර්තුවේ දී එය නැවත සාමාන්‍ය මට්ටමට පත්වීම ඉදිකිරීම් කර්මාන්තයේ මෙම ඉහළ වර්ධනයට බෝහෝ සෙයින් දායක වී ඇත.

## 1.4 සේවා ක්‍රියාකාරකම්

මුළු දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 56.0 ක ඉහළම දායකත්වයක් සපයන සේවා ක්‍රියාකාරකම් 2016 තෙවැනි කාර්තුව සඳහා සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කර ඇත.

2016 තෙවැනි කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයට සියයට 11.1 ක දායකත්වයක් සපයන "තොග සහ සිල්ලර වෙළඳාම" 2015 තෙවැනි කාර්තුවේ සියයට 7.8 ඉහල යාමට සාපේක්ෂව, 2016 තෙවැනි කාර්තුවේදී එය තව දුරටත් සියයට 4.6 ක වර්ධනයක් වාර්තා කරයි. තොග සහ සිල්ලර වෙළඳාම් කාර්යයෙහි එකතුකළ අගය කෙරෙහි මුළු ආනයන හා මුළු දේශීය නිෂ්පාදන වල වෙනස්වීම බලපානු ලබන බැවින් එම නිසා මෙම ආර්ථික කටයුත්තෙහි වර්ධන අනුපාතය ආනයන, කෘෂිකාර්මික නිෂ්පාදන සහ කාර්මික නිෂ්පාදන යන විචල්‍යයන් ත්‍රිත්වයෙහි වෙනස්වීම මත පදනම් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛනවලට අනුව පෙර වර්ෂයේ තෙවැනි කාර්තුවේ සිට මෙම වර්ෂයේ තෙවැනි කාර්තුව දක්වා මුළු ආනයන වියදම රු. මිලියන 628,816 සිට රු. මිලියන 673,373 දක්වා සියයට 7.1 කින් වැඩි වී ඇත. ඊට අමතරව කෘෂිකර්මාන්ත අංශයෙහි මුළු නිමැවුම් වටිනාකම පෙර වර්ෂයේ තෙවැනි කාර්තුව හා සසඳන කළ මෙම වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 5.6 කින් ඉහළ ගොස් ඇත. කර්මාන්ත ආර්ථික කටයුතු වල නිමැවුම් වටිනාකම, 2016 තෙවැනි කාර්තුව සඳහා රු. මිලියන .1,597,333 සිට රු. මිලියන 1,819,616 දක්වා සියයට 13.9 කින් ඉහළ ගොස් ඇත.

"මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම" යන උප ක්‍රියාකාරකම, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් උප කාර්යයන්ගෙන් සමන්විත වන අතර 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී සමස්ථ එකතු කළ අගය සියයට 2.5ක වර්ධනයක් වාර්තා කර ඇත. ගුවන් සේවා වාර්තා අනුව මෙම කාර්තුවේ ආදායම සියයට 7.45කින් ඉහළ ගොස් ඇත. ගොඩබිම ප්‍රවාහන සේවාවන්ගේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය සියයට 2.1ක වර්ධනයක්ද වාර්තා වේ.

පසුගිය වසරේ තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දිවයිනේ මුළු වාහන ලියාපදිංචි කිරීමේ වර්ධනය සියයට 100.11කින් ඉහළ ගොස් ඇති අතර මෝටර් රථ, ද්විත්ව කාර්යය රථ හා ලොරි රථ ලියාපදිංචියෙහි වර්ධනය පිළිවෙලින් සියයට 5.88, සියයට 22.88 හා සියයට 52.59කින් පහළ ගොස් ඇත. ත්‍රීරෝද රථ, බස් රථ හා ගොඩබිම ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා අනෙකුත් රථ ලියාපදිංචියෙහි වර්ධනය පිළිවෙලින් සියයට 14.84, සියයට 99.5 හා සියයට 254.59කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම සියයට 8.09කින් වැඩි වී ඇති අතර, ඒ සඳහා දරා ඇති පිරිවැයද සියයට 18.16 කින් අඩු වී ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම සියයට

18.98කින් වැඩි වී ඇති අතර, ඒ සඳහා දරා ඇති පිරිවැයද සියයට 3.75 කින් වැඩි වී ඇත. මෙම වර්ධනයන් මෙම ආර්ථික කටයුත්තෙහි සමස්ථ වර්ධනයට බලපා ඇත.

“තැපැල් හා කුරියර් සේවා” ආර්ථික කටයුත්ත සැලකීමේදී 2016 තෙවැනි කාර්තුවෙහි දරා ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 3,182ක් වී ඇති අතර එය 2015 තෙවැනි කාර්තුවට සාපේක්ෂව සියයට 7.3 ක වැඩිවීමකි. තවද මෙහි මූර්ත එකතු කළ අගය 2016 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා සියයට 6.2ක වර්ධනයක් වාර්තා කරනු ලබයි.

පෙර වර්ෂයේ තෙවැනි කාර්තුව හා සළකා බලන විට මෙම වර්ෂයේ තෙවැනි කාර්තුවේ “නවාතැන්, ආහාර හා බීම වර්ග සැපයීම” යන උප ආර්ථික කටයුත්ත සියයට 3.9 ක ඉහළ යාමක් වාර්තා කරයි. 2015 වර්ෂයේ තෙවැනි කාර්තුව හා සසඳන විට සංචාරකයින්ගේ පැමිණීම සියයට 12.0ක වර්ධනයක් පෙන්නුම් කරයි. හෝටල් කාමර භාවිතා කිරීම ද සියයට 75.1 සිට සියයට 75.3 දක්වා වැඩි වී ඇත. ඒ අනුව “නවාතැන් ආහාර වර්ග හා බීම වර්ග සැපයීම” යන උප අංශයෙහි නිමවුමෙහිද පෙර සඳහන් කළ පරිදි 4.0 ක ඉහළ යාමක් දක්නට ඇත.

පසුගිය කාර්තුවලදී මෙන්ම සන්නිවේදන සේවාවන් හී මූර්ත එකතු කළ අගය 2016 තෙවැනි කාර්තුවේ දී ද සියයට 11.7කින් ඉහළ ගොස් ඇත. විදුලි සංදේශ සේවාවන් සපයන ප්‍රධාන ආයතනවල ලාභය බොහෝ සෙයින් ඉහළ ගොස් ඇත.

“පරිගනක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්” යන උප ක්‍රියාකාරකම 2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 5.8 කින් පුළුල් වී ඇත.

“මූල්‍ය සේවා සැපයීම” 2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 12.9කින් වර්ධනය වීඇත. පෙර වර්ෂයේදී එම කටයුත්ත සියයට 13.8කින් වර්ධනය වී තිබුණි. 2016 තෙවැනි කාර්තුවේදී බලපත්‍රලාභී වානිජ බැංකු සහ බලපත්‍ර විශේෂිත බැංකු සඳහා සේවක ගෙවීම් සියයට 17.5කින් වැඩි වී ඇත. එමෙන්ම මෙම ආයතන සඳහා බදු ගෙවීමට පෙර ලාභය සියයට 18.4කින් වැඩි වී ඇත. මූල්‍ය සේවාවන්හි භාවිතය, ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මඟින් පෙන්නුම් කරයි. ඒ අනුව ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම 2016 තෙවැනි කාර්තුව තුලදී පිළිවෙලින් සියයට 15.7කින් සහ සියයට 16.6කින් වර්ධනය වී ඇත. 2016 වර්ෂයේ තෙවැනි කාර්තුවේදී “හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය” සහ “හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය” පිළිවෙලින් සියයට 12.9ක් සහ සියයට 7.6ක් ලෙස සටහන් විය. 2015 වර්ෂයේ අදාල කාර්තුවේ දී එම දර්ශකයන් සියයට 11.0ක් සහ සියයට 6.0ක් ලෙස සටහන්ව ඇත.

”රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය” කිරීමේ කටයුතු වල මූර්ත එකතු කල අගය 2016 තෙවැනි කාර්තුවේ දී සියයට 12.3ක වර්ධනයක් වාර්තා කර ඇත. එය 2015 වර්ෂයේ

තෙවැනි කාර්තුවේ දී සියයට 12.8 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම කාර්තුවෙදී රක්ෂණ සමාගම්වල සේවක ගෙවීම් මෙන්ම බදු පෙර ලාභයේ ද වර්ධනයක් වාර්තා වී ඇත. මෙම සේවාව කෙතරම් භාවිත වූයේදැයි නිරූපනය කෙරෙන රක්ෂණ වාරික වටිනාකම සහ ගෙවන ලද වන්දි මුදල් හි එකතුව අදාළ කාර්තුවේදී සියයට 16.2කින් ඉහල ගොස් ඇත.

දළදේශීය නිෂ්පාදිතයට සියයට 5.2 ක දායකත්වයක් සපයන "දේපළ වෙළඳාම්" උප අංශය 2015 වර්ෂයේ තෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 වර්ෂයේ තෙවැනි කාර්තුව තුලදී සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කර ඇත.

"වෘත්තීය සේවා" යන ආර්ථික ක්‍රියාකාරකම ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් " නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහනිර්මාන හා ඉංජිනේරු කාර්යයන්", " විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්" "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්" සහ "ප්‍රකාශන කාර්යයන්", "පශු වෛද්‍ය කාර්යයන්". "කුලී හා බදු කාර්යයන්", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ. ඉහත දැක්වෙන කාර්යයන් සඳහා නිමවුම් අගය ගණනය කරනු ලබන්නේ වැට් දත්ත පදනම් කරගෙන වේ. ඒ අනුව ඉහත උප අංශයන් සඳහා ගණනය කරනු ලබන මුළු නිමවුමෙහි 2015 වර්ෂයේ තෙවැනි කාර්තුව හා සසඳන කළ සියයට 3.6 ක අඩුවීමක් දක්නට ඇත.

"කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ අනෙකුත් පෞද්ගලික කාර්යයන්" යන ආර්ථික කටයුත්ත "වෙනත් පුද්ගල සේවා කාර්යයන්" යටතේ ම සදහන් කර ඇති අතර එම කාර්යයෙහි නිමැවුම් අගය ද 2015 තෙවැනි කාර්තුව හා සංසන්දනය කර බලන කල සියයට 1.7කින් ඉහළ ගොස් ඇත.

ජාතික ගිණුම් අංශය,

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දු. ක. 940112147071 ෆැක්ස් : 940112877938 ඊ මේල් : national.accounts@statistics.gov.lk